**SAMODHANA**

**Vol. 9, Issue II, (December) 2020**

Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

***The Journal of Faculty of Social Sciences and Humanities***

# සමාජානුයෝජනයෙහිලා මවගේ භූමිකාව සහ සමාරම්භක සිංහල ප්‍රබන්ධ කතාව

**එච්. කේ. සී. කේ. රණවීර**

සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

*Correspondence: kumudukr@yahoo.com

Received: 28 September 2020

Accepted: 15 December 2020

**Abstract**

The evolution of human society is highlighted through the family unit which is the basic social institute. Therefore the study of modern Sinhala fiction can be based on the dipiction of families in their plot and themes. Sociology of literature has showed that literature is not merely creativity but systematic mirroring of the contemporary society in a sociological framework. Therefore, a work of literature reflects the reality of the timeframe and the sociology which it relates. Thus identifies the sociology of the specific timeframe. During the early colonical period, the massive and dramatic changes of families were identified through the role of the mother. Accordingly, the social integration of the role of the mother in the sociological framework of modern Sinhala fiction can be studied through early works of modern Sinhala fiction. Hence socialization of the children in this era is also studied specifically focused on the role of the mother.

Keywords: colonial period, mother's roll, Sinhala fiction, socialization of children, sociology of literatur

## 1. හැඳින්වීම

'සාහිත්‍ය වනාහි එය බිහිවන යුගයෙහි පර්යාවලෝකනයකි.' යන්න පිළිගත් ප්‍රවාදයකි. දහනම වන සියවසෙහි අග භාගයේ මෙරට බිහි වූ නව ප්‍රබන්ධ කතාව මෙකී දෘෂ්ටියෙන් විමසා බැලීම මෙහිදී සිදු කෙරේ. නව සිංහල ප්‍රබන්ධ බිහි වූයේ මෙරට සමාජ, ආර්ථික පරිස්ථිතියෙහි ප්‍රබල විපර්යාසයක් ඇති කිරීමෙහි සමත් යටත්විජිත පාලනය ක්‍රියාත්මක වූ යුගයකදී ය. ඒ අනුව අභිනව සමාජ, ආර්ථික ක්‍රමයක සමාජානුයෝජන ක්‍රියාවලියෙහිලා සිදු වූ වෙනස්කම් පූර්ව යටත්විජිත යුගයට සාපේක්ෂව තුලනාත්මකව විමර්ශනය කිරීමේ ප්‍රවේශයක් ලෙස මවගේ සමාජානුයෝජන භූමිකාව පිළිබඳව මෙහිදී විමසා බලනු ලැබේ.

## 2. ක්‍රමවේදය

නව ප්‍රබන්ධ ඇසුරෙන් මෙහිදී මූලික වශයෙන් සාකච්ඡා කෙරෙනුයේ විසිවන සියවස මුල් භාගයෙහි මෙරට ක්‍රියාත්මක වූ මවකගේ සමාජානුයෝජන ක්‍රියාවලිය පිළිබඳවයි. එයට ප්‍රවේශයක් ලෙස පූර්ව යටත්විජිත යුගයෙහි මෙරට ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික පවුල් සංස්ථාවෙහි සමාජානුයෝජන  ක්‍රියාවලිය සම්බන්ධයෙන් ද අධ්‍යයනය කරන ලදි. අනතුරුව පූර්ව යටත්විජිත යුගයට සාපේක්ෂ ව යටත්විජිත යුගයෙහි පවුල් සංස්ථාවෙහි සමාජානුයෝජන ස්වරූපය තුලනාත්මක ව විශ්ලේෂණය කරමින් සාහිත්‍යික මූලාශ්‍රය මගින් ප්‍රතිනිර්මිත මවකගේ සමාජානුයෝජන කාර්යභාරය කුමන ආකාර වන්නේදැ යි විමසා බලන ලදි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අදාළ යුගය නියෝජනය කරන නව ප්‍රබන්ධ කෘති භාවිත කරන ලදි.  ද්විතීයික මූලාශ්‍රය ලෙස යටත්විජිත යුගය සහ පූර්ව යටත්විජිත යුගය පිළිබඳ සිදු කෙරුණු ප්‍රාමාණික සාහිත්‍යික මූලාශ්‍රය උපයෝගී කොට ගැනුණි.

## 3. සාකච්ඡාව

සමාජීය ආයතනයක් ලෙස පවුල විවිධ කෘත්‍යය ඉටු කරන අතර සමාජානුයෝජනය එහි ප්‍රධාන කෘත්‍යයක් ලෙස දක්වේ (Rao 1999 : 395), (Robertson 1980 : 317). පුද්ගලයකු සමාජානුයෝජනය කිරීමෙහි ශක්‍යතා සහිත පවුලෙන් පරිබාහිර වූ විකල්ප, කේවල සමාජ සංස්ථාවක් ක්‍රියාත්මක නොවේ.(Robertson 1980 : 317).පවුල හුදෙක් සමාජයට තම සාමාජිකයන් ප්‍රදානය කරන නිල ආයතනයක් පමණක්ම නොවේ. දරුවන් සමාජයට යෝග්‍ය පරිදි මෙන්ම ප්‍රයෝජනවත් වන ආකාරයෙන් නිර්මාණය කරන නැතහොත් අනුයෝජනය කරන ආයතනය ලෙස ද සමාජයේ ක්‍රියාත්මක වේ. මේ අනුව සමාජානුයෝජනය මගින් සමාජයක සිරිත් විරිත්, ඇගයුම් සහ පොදුවේ මෙහි සමස්තය වන සංස්කෘතිය නව පරම්පරාවට පවරා දීම සිදුවෙයි. මෙය එක් අතකින් අධ්‍යාපන ක්‍රියාමාර්ගයක් සේද ක්‍රියාත්මක වන බැවින් අධ්‍යාපනික කෘත්‍යයක් ලෙසින් ද (Educational Function)  හඳුන්වයි. අවසන සමාජානුයෝජනයෙන් සිදු කෙරෙනුයේ පුද්ගලයාගේ චර්යාවෙහි පාලනයක්, ශික්ෂණයක්, සම්මත බවක් හෝ කිසියම් රටාවක් ඇති කිරීමයි (Murdock 1949).

සමාජානුයෝජනය මූලික වශයෙන් ප්‍රාථමික සමාජානුයෝජනය හා ද්විතීයික සමාජානුයෝජනය ලෙසින් දෙයාකාර වේ. ප්‍රාථමික සමාජානුයෝජනය යනු පුද්ගලයකු මුල් වරට සමාජය පිළිබඳව, තමා අවට ලෝකය පිළිබඳව දැනුවත් වී ඒ අනුව හැඩගැසීමේ

ක්‍රියාවලියයි. පුද්ගලයකු උපතේ සිට ජීවිතයේ පළමුව සම්බන්ධ වන සමාජ සංස්ථාව ලෙස පවුල මගින් යම් යම් දේ අභ්‍යන්තරිකරණය කර ගනියි. ඒ අනුව දරුවකුගේ ජීවිතයේ මුල් අවුරුදු පහ හෝ හය කාලය එනම් ළමා කාලය ශාරීරිකව මෙන්ම මානසිකව ද සංවර්ධනය කර ගනී. මේ අනුව අවසන දෙමාපියන් පිළිගත්, අගයන අනුමත කරන සංස්කෘතිය දරුවකු ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලිය මගින් ග්‍රහණය කර ගනී.

පවුල මගින් ප්‍රාථමික සමාජානුයෝජනය ලබන දරුවා පාසල මගින් ද්විතීයික සමාජානුයෝජනය ලබයි. ද්විතීයික සමාජානුයෝජන කාරකයක් ලෙස පාසල ක්‍රියා කළ ද දරුවා කොතරම් දුරට පාසල් අධ්‍යාපනය ලබා දෙන්නේ ද යන්න මෙන්ම කුමන මට්ටමේ පාසලක, කුමන විෂයන් හදාරන්නේදැයි තීරණය කරනුයේ පවුලයි. එනම් දෙමාපියන්ගේ තීරණයයි. දරුවන් ද්විතීයික සමාජානුයෝජනය සඳහා පාසල් වෙත යොමු කිරීමේ නව යටත්විජිත සමාජ තත්වය සමගම පවුලෙහි සාමාජිකයින්ගේ තත්වය වෙනස් වන්නට විය. එනම් යටත්විජිත යුගයේ දී ද්විතීයික සමාජානුයෝජන කෘත්‍යය පවුලෙන් පරිබාහිර සුවිශේෂ අධ්‍යාපන ආයතන වෙත විතැන්වීම සමාජානුයෝජනය සම්බන්ධයෙන් පවුල සතු වූ වගකීම් නැතහොත් පූර්ණ බලය වෙනස්වීමට හේතු විය. මෙය නූතන ප්‍රබන්ධ බහුතරයක් මගින් සනාථ වන්නකි. තත් යුගයේ දී ස්ත්‍රී අධ්‍යාපනය සම්බන්ධයෙන් ද නව පසුබිමක් සැකසුණි. විශේෂයෙන්ම බාලිකා පාසල් විවෘත කරමින් කාන්තා අධ්‍යාපනය දියුණු කළ අතර බටහිර ආකල්ප හා අගයන් සමාජගත කිරීමේ අවකාශ ද ඉන් විවර කර ගැනිණි. ඒ ඔස්සේ සාපේක්ෂ වශයෙන් නිදහස් අදහස් මෙන්ම නව ආකල්පවලින් හෙබි කිසියම් උගත්කමක් සහිත ස්ත්‍රීන් සමාජගත වුණි. මෙම යථාර්ථය ප්‍රබන්ධ රචකයින්ගේ අවධානයට යොමු වූ ආකාරය අධ්‍යයනයට බඳුන් වූ ප්‍රබන්ධ ඇසුරෙන් සනාථ කර ගත හැකි විය. ඒ. සයිමන් ද සිල්වාගේ මීනා (1906), අපේ ආගම (1910), ඩබ්ලිව්.ඒ. සිල්වාගේ පාසල් ගුරුවරී (1924) සහ මාර්ටින් වික්‍රමසිංහගේ ලීලා (1914) හා මිරිඟුව (1925) ප්‍රබන්ධයන්හි ප්‍රධාන ස්ත්‍රී චරිත මෙයට නිදසුන් ලෙස ඉදිරිපත් කළ හැකිය.

පූර්ව යටත්විජිත සමාජයේ මෙන්ම යටත්විජිත සමාජයේ ද දරුවකුගේ සමාජානුයෝජනයේ දී කේන්ද්‍රීය සංජානනය ලෙස පවුල ක්‍රියා කරයි. පැරණි කෘෂිකාර්මික සමාජවල දරුවකුගේ සමාජානුයෝජනයේ දී බොහෝ කෘත්‍යයන් ඉටු කිරීමෙහිලා පවුල මූලික විය. එකල විවිධ අධ්‍යාපනික ආයතන නොතිබීම හේතුවෙන් දෙමාපියන් දරුවාගේ පූර්වාචාර්යවරුන් ලෙසින් පමණක් නොව දරුවාගේ ආචාර්යවරුන් ලෙසින් ද ක්‍රියා කර ඇත. ඒ අනුව පවුල තුළින්ම අධ්‍යාපන කෘත්‍යය ද ඉටු කෙරිණ. මක් නිසාද යත් පූර්ව යටත්විජිත සමාජයේ අධ්‍යාපනය යනුවෙන් අදහස් වූයේ පියාගේ රැකියාව දරුවන්ට හුරු කරවීම වූ බැවිනි. ඒ අනුව කුලය මත පදනම්ව තිබූ වෘත්තීය පුහුණුව පියා විසින් ස්වකීය පිරිමි දරුවන් වෙත ලබා දීම නිරතුරුව සිදු කරන ලදී. සාම්ප්‍රදායික සිංහල සමාජයේ පවුලක පියා පවුලේ නිෂ්පාදකයා මෙන්ම ප්‍රධානියා විය. එමෙන්ම ගුරුවරයා, ආරක්ෂකයා, මාර්ගෝපදේශකයා ආදී වශයෙන් බහුකාර්යමය පුද්ගලයකු විය. ඒ අනුව මෙම සමාජයෙහි පවුල යනු නිෂ්පාදන ඒකකයක් වූ අතර පියා එහි ප්‍රධානියා ලෙස ක්‍රියා කළේය (ගයිගර් 1969 : 54). දරුවන් අනාගත වෘත්තීන්ට පුරුදු පුහුණු කරවීම සමාජානුයෝජනය නැතහොත් අධ්‍යාපනය යනුවෙන් එදා සමාජය අර්ථ ගන්වා තිබිණි. විශාල කර්මාන්ත සම්බන්ධව දැනුමක් නොතිබුණු මෙකල ප්‍රධානතම රක්ෂා මාර්ගය වූයේ ගොවිතැනයි

(ආරියපාල (1961) 1996 ‍: 320). මෙය මූලික වශයෙන්ම පියාගෙන් පුතාට උරුම වූ රැකියාවක් වූවා සේම ඒ සඳහා අවශ්‍ය දැනුම හා අවබෝධය කුඩා කල සිටම පවුල වෙතින්ම එනම් සමාජානුයෝජන ක්‍රියාවලියෙන් ඇරඹී ක්‍රමයෙන් වර්ධනය වන ලෙස පසුබිම සැකසී තිබිණ.

විස්තෘත පවුල් ක්‍රමයක් ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සිංහල සමාජයේ දරුවකු සමාජානුයෝජනයෙහිලා දෙමාපියන්ට අමතර වශයෙන් මව්පස හෝ බොහෝ විට පියපස ඥාතීහු කටයුතු කළහ. පියාගේ පියා සහ මව නැතහොත් සීයා සහ ආච්චී මෙහි දී ප්‍රධාන වේ. ශිල්ප ශ්‍රේණි පදනම් කොට ගත් පැරණි ගම්වල ජීවත් වූ බහුතරය එකම ඥාති පරපුර නියෝජනය කරන්නෝ වූහ. එහෙයින්ම දරුවකුගේ කුඩා අවධිය බොහෝ විට ස්වකීය බන්ධූන් නැතහොත් ඥාති සමූහයක් සමඟ සමාජානුයෝජනය විය. දරුවාගේ වෘත්තීය කුසලතා හෝ අදාළ කුලය ඇතුළත උරුම වූ අගයන් හෝ ආකල්ප පෝෂණය කිරීමෙහිලා මෙකී විස්තෘත පවුල් ක්‍රමය ඉවහල් විය. මෙසේ අනුයෝජනය වන දරුවකුගේ විධිමත් අධ්‍යාපන කටයුතු ආරම්භ වූයේ වයස අවුරුදු පහේ දී බව ඓතිහාසික මූලාශ්‍රය මගින් සනාථ කරයි (ආරියපාල (1961) 1996 ‍: 271).

බොහෝ විට ඒ ඒ පවුලේ සමාජ තත්ත්වය හා වත්කම් අනුව දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සිදු වූ අතර එය මූලික වශයෙන් පිරිමි දරුවන් ලද අවස්ථාවක් විය. භික්ෂූන් මූලික වශයෙන් ගුරුවරුන් ලෙස කටයුතු කළ අතර පන්සල අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය විය (ආරියපාල (1961) 1996 ‍: 271). මූලික වශයෙන් පැවිදි සිසුන් වෙනුවෙන් විවෘත වූ මෙකී විද්‍යාස්ථාන ක්‍රමයෙන් ගිහි සිසුන් සඳහා ද විවෘත විය. ගමේ පන්සල මේ අනුව ගමේ පාසල ලෙස හැඳින්විණි. පූර්ව යටත්විජිත යුගයේ දී පිරිමි ළමයින්ගේ අධ්‍යාපන කටයුතු භික්ෂූන් විසින් සිදු කරන ලද අතර එංගන්තයේ මධ්‍යතන කාලයේ දී ගමේ පූජකයන් අතින් මෙය සිදු වූ බව ආනන්ද කුමාරස්වාමි පවසයි (Coomaraswami 1908 : 49).

19 වන සියවස අග හා 20 වැනි සියවස මුල් භාගයේ දී මෙරට දරුවකු ලබන අධ්‍යාපනයේ ස්වභාවය හා ගුණාත්මක බව තීරණය කරන සාධකයක් වූයේ ස්ත්‍රී පුරුෂභාවය, සමාජ පන්තිය, භාෂාව, වර්ගය හා උපන් ප්‍රදේශයයි. 1890 දී දකුණේ කොග්ගල ග්‍රාමයේ උපත ලද මාර්ටින් වික්‍රමසිංහ යටත්විජිත යුගයේ ඔහු ලැබූ පාසල් අධ්‍යාපනය පිළිබඳ අත්දැකීම් මෙසේ ඉදිරිපත් කරයි ‍:

> ''වයස අවුරුදු පහේ දී අන්දිරිස් ගුණානන්ද නම් හිමි නමක් විසින් ගෙදරට පැමිණ සිංහල හෝඩිය උගන්වන ලදී. පසුව ගෙදරදී හා ගමේ පන්සලේ දීත් අකුරු ඉගැන්වීම සිදු විය. දේවනාගරී අක්ෂර ඉගෙනීම තුළින් හිතෝපදේශය කටපාඩමින් කිව හැකි විය. දෙවසකට පසුව ස්වභාෂා පාසලකට ඇතුළු වී, අපහසුවකින් තොරව ඔහු ඉගෙනීමේ යෙදිණි. 1897 දී ගාල්ලේ බෝනවිස්ටා ඉංග්‍රීසි පාසලට ඇතුළු වී එහි සිටි දෙවස තුළ ඉංග්‍රීසි බසට අමතරව ලතින් භාෂාව ද හැදෑරීය. පියාගේ මරණින් පසුව අහංගම ස්වභාෂා පාසැලකට ඇතුළු වූ නමුත් ඉගෙනීම ගැන උනන්දුව හීනවීම නිසා එය කෙළවර විය. එහෙත් ඉංග්‍රීසි පොතපත කියවීමේ රුචිය දිගටම පැවතීම තුළින් ලබා ගත් දැනුම් සම්භාරය සුවිශේෂ වේ'' (වික්‍රමසිංහ 1961 ‍: 410).

බහුකාර්ය ඒකකයක් වූ සාම්ප්‍රදායික සිංහල පවුල කුල ක්‍රමය මත පදනම් වූ ශ්‍රම විභාජිත සමාජ ඒකකයකි. කුලයට ආවේණික රැකියාව හා සම්බන්ධ දැනුම එක්රැස්වී තිබුණේ පවුලේ වැඩිහිටියන් වෙතයි. ඒ අනුව සාම්ප්‍රදායික තාක්ෂණය හා විවිධ දැනුම් මූලයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම ගලා ගියේ ද වැඩිහිටියන් මගිනි. එහෙයින් වැඩිහිටියන් ලෙස තමා සතු සාම්ප්‍රදායික දැනුම සහ පරිචය ක්‍රමානුකූලව තම ඉදිරි පරම්පරාවලට පවරාදීම අත්‍යවශ්‍ය වූවකි.

ස්වයංපෝෂිත කෘෂි අර්ථ ක්‍රමය බිඳ වැටී වාණිජ ධනවාදී අර්ථ ක්‍රමය ගොඩනැගීමත්, ඒ හේතුවෙන් පුද්ගලයා වැටුප් ශ්‍රමිකයකු බවට පත්වීමත්, නාගරික සංක්‍රමණයත්, අධ්‍යාපනයෙහි ප්‍රතිඵල ලෙස ඇති වූ ආකල්පමය හා ආයතනික වෙනස්කම් ද අඩු වැඩි වශයෙන් විස්තෘත පවුල් සංස්ථාව සතු ශක්‍යතා ස්වරූපය වෙනස් වීමට හේතු විය.

ප්‍රාථමික සමාජානුයෝජන ඒකකය ලෙස පුළුල් කාර්යභාරය යටත්විජිත සමාජයේ දී ද නොවෙනස්ව ක්‍රියාත්මක වූ ආකාරය අදාළ සාහිත්‍යික මූලාශ්‍රය ඇසුරින් සනාථ වේ. මූලික වශයෙන්ම දරුවන්ගේ සමාජානුයෝජනය පවුලක මවක් සතු වූ වගකීමක් ලෙස සැලකුණු බව අදාළ ප්‍රබන්ධ විමර්ශනයෙන් පැහැදිලි වේ.

වර්ෂ 1908 දී එම්.සී.කේ. පෙරේරා විසින් රචනා කරනු ලැබූ සිරිමැදුර ප්‍රබන්ධයෙහි දැක්වෙන පරිදි දරුවකුගේ විශේෂයෙන්ම ගැහැනු දරුවකුගේ ක්‍රියාකාරකම්වලින් ඇයගේ මවගේ අනන්‍යතාව ප්‍රකාශයට පත්වෙයි. ඒ අනුව සමාජය විසින් මව සහ දියණිය අතර ගොඩනගන සම්බන්ධය මවකට පවුලක් තුළ මෙන්ම සමාජයෙහි ද අත් නොහැරිය හැකි වගකීමක ස්වරූපය ආරෝපණය කෙරුණක් වෙයි. එංගල්ස්ට අනුව විවාහය මගින් ස්ත්‍රිය පුරුෂයාගේ පීඩාවට පත්වේ. මිනිස් ඉතිහාසයේ මුල්ම පන්ති ගැටුම ලෙස දක්වන පුරුෂ පක්ෂය විසින් ස්ත්‍රී පක්ෂය යටපත් කර ගනු ලැබීම විවාහයත් සමග ඇරඹෙයි (එංගල්ස් 1979 : 67-68). දරුවන්ගේ ප්‍රාථමික සමාජානුයෝජන වගකීමක් මව වෙත කේන්ද්‍රගත කොට ඇති ධනේශ්වර සමාජයේ න්‍යෂ්ටික පවුල් සංස්ථාව පුරුෂයාට නොපවරන ස්ත්‍රිය වෙත පමණක් පවරන දරුවන් සම්බන්ධ මෙවන් වගකීම් හේතුවෙන් පවුල ඇතුළත දෙවනුවත් ස්ත්‍රිය පීඩාවට පත් කරයි. සිරිමැදුර ප්‍රබන්ධය 'යහපත් භාර්යාවක්' සහ 'යහපත් සුවිනීත' දූදරුවන් ලැබීම පවුල වාසනාව ලෙස දක්වන්නේ යටත්විජිත යුගයේ බහුලව ක්‍රියාත්මක වූ න්‍යෂ්ටික පවුල් සංස්ථාව ඇසුරෙනි :

> ''මක් නිසා ද යත් මේ බාලිකාව මෙතරම් යහපත් කඩිසර සීලාචාර තැනැත්තියක් වීමට ඇගේ මව ද එවැනි තැනැත්තියක් විය යුතුය. අනේ මේ ලෝකයෙහි යහපත් භාර්යාවක් හා යහපත් සුවිනීත දූදරුවන් ලැබීමට වඩා අන්‍ය ආශිර්වාදයක් කොයින්ද?'' (පෙරේරා 1908 : 52).

පෙරේරාගේම තවත් ප්‍රබන්ධයක් වන මගේ පෙම්බරී (1908) කෘතිය ද සමාජානු-යෝජනයේ පූර්ණ වගකීම පවුලේ මව වෙත පමණක් පවරා ඇති කෘතියකි. මේ අනුව දරුවන්ගේ චර්යාමය ගැටලු එනම් සමාජ අනුමැතියෙන් තොර හැසිරීම් හා ගෘහ සංවිධානමය දුබලතා සියල්ලෙහි වගකීම පවුලක මව විසින් දැරිය යුතුය :

''අපරික්ෂාකාරී මවකගේ දරුවෝ කිසි විටෙකත් පිළිවෙළට වැඩක් කරන ක්‍රමය මේ යැයි නොදනිත්. ඇඳුමෙන් ද, කෑම බීමෙන් ද, ගමන් යාමෙන් ද යන මෙකී සියල්ලෙන්ම පිරිහෙන අන්දමට විනා කිසි පිළිවෙළකට කටයුතු නොකරති. ගෘහ සංවිධානය නොදත් අපරීක්ෂාකාරී භාර්යාවක් ඇති ගේ දොර ඇති වන බල්ලන් බලලුන්ගේ ද යන තිරිසනුන්ගේ පවා විශේෂ වෙනසක් ඇති බැව් බොහෝ විට දක්නට ලැබේ'' (පෙරේරා 1908 ඃ 50).

මෙහි දී ගැහැනු දරුවන් පමණක් නොව, පොදු ගැහැනු පිරිමි දෙපිරිස සම්බන්ධ සමාජානුයෝජන වගකීම් මව වෙත පැවරී ඇති ආකාරයත් ප්‍රකට කෙරේ. ''සමාජය වෙත විවිධ කර්තව්‍යයන් ඉටු කරන කේන්ද්‍රීය ඒකකය වශයෙන් පවුල, ආගම, පැරණි සාහිත්‍ය සහ බහුජන සන්නිවේදන මාධ්‍යයන් ද විසින් වැඩි වැඩියෙන් තහවුරු කරනු ලැබ ඇත'' (තිරුචන්ද්‍රන් 1995 ඃ 07).

වැඩවසම් ක්‍රමය පූර්ණ වශයෙන් අභාවයට නොගොස් එහි නෂ්ටාවශේෂ මත ධනේශ්වර ක්‍රමය වර්ධනය වූ ලාංකේය සමාජයේ වැඩවසම් දෘෂ්ටිය ඇසුරු කොට පවුල් සංස්ථාව ක්‍රියාත්මක වන කුටුම්බවල මෙන්ම අනෙක් පසින් මාක්ස්වාදී ස්ත්‍රීවාදය කාන්තා පීඩනයේ ප්‍රභවය වශයෙන් සලකන ධනවාදී පවුල් ඒකකවලත් යන ස්ථාන දෙකෙහි දීම පොදුවේ ස්ත්‍රිය පීඩාවට පත් වේ. විමර්ශිත ප්‍රබන්ධමය මූලාශ්‍රය මගින් මෙම සමාජ යථාර්ථය සනාථ කරනු ලැබ ඇති අතර මාතෘත්වය, නැතහොත් මව සහ භාර්යාව පිළිබඳ පාරම්පරික ප්‍රතිබිම්බ මගින් කාන්තාව සම්ප්‍රදායික සීමාවන් අතර රැඳී සිටීම සහතික කරන පීතෘමූලික ව්‍යූහ පිළිබඳ අදහස් යටත්විජිත සමාජයට ද වලංගු වී ඇති ආකාරය උක්ත ප්‍රබන්ධගත නිදසුන් මගින් තව දුරටත් අවධාරණය කෙරේ.

අනගාරික ධර්මපාල ප්‍රමුඛ කොට ගත් මෙරට ජාතික ව්‍යාපාරයෙහි සාමාජිකයකු වූ පියදාස සිරිසේනගේ සාහිත්‍යික ආභාසය එම්.සී.එෆ්. පෙරේරාගේ ප්‍රබන්ධවල ද දක්නට ලැබේ. විශේෂයෙන්ම ජයතිස්ස සහ රොස්ලින් නවකතාවේ සඳහන් අදහස්වලට සමාන අදහස් පළ කිරීමට ඉදිරිපත් වී ඇති බව පෙනේ (පෙරේරා 1910). සිංහලයන් පැවත එන්නේ ආර්යයන්ගෙන් වන බව පිළිගත් ධර්මපාල, ''ආර්ය බෞද්ධ'' සංස්කෘතියක් සහිත සමාජයක් පරිකල්පනය කළේය. මෙකී සමාජයෙහි ස්ත්‍රියට සහ පුරුෂයාට වෙන් වූ තත්ව සහ භූමිකා පැහැදිලිව නිරීක්ෂණය කර තිබේ. එමෙන්ම ජාතියට ස්ත්‍රියගෙන් සහ පිරිමියාගෙන් ඉටු විය යුතු සේවය කුමක්ද යන්න පිළිබඳව ද අවධානය යොමු කළ ඔවුහු, දියුණු තාක්ෂණික සමාජයක් ගොඩනැංවීමේ නායකත්වය හා වගකීම පුරුෂයාට පැවරූහ. එමෙන්ම සංස්කෘතිය ආරක්ෂා කර ගනිමින් ඉදිරියට ගෙනයාම, කාන්තාවන්ගේ කාර්යභාරය ලෙස දැක්වූහ. එනම් නවීකරණය වීම සම්බන්ධ ක්‍රියාවලිය පුරුෂයන් සිදු කරන අතර ස්ත්‍රීන් කළ යුත්තේ යහපත් මවක, බිරිඳක, ගෘහණියක ලෙස පවුලේ කාර්යභාරය ඉටු කරමින් පුරුෂයාට සමාජ නවීකරණය කිරීමට සහ සංවර්ධනය කිරීමට කාලය ඉතිරි කර දීමයි (ජයවර්ධන 2006 ඃ 469).

මෙරට ජාතික ව්‍යාපාරය ප්‍රබලව පැවති අවධියක එය මෙහෙය වූ නායකයකු ලෙස රටවැසියන් අතර ජනප්‍රිය වූ පියදාස සිරිසේනගේ නවකථාවලට පදනම් වූ ජාතිකවාදයටත්, ආගම්වාදයටත් තත්කාලීන සමාජයෙහි අනුමැතිය ලැබිණි. විසිවන සියවස මුල් දශකවල

දී ඔහුගේ නවකතා සිංහල පාඨක ලෝකය පුළුල් කිරීමට හේතු වූ අතර පාඨක රුචිය ද සිරිසේනගේ නවකථා කෙරෙහි බලපෑවේය (රාජකරුණා (1970) 2012 : 108). අනගාරික ධර්මපාලගේ ජාතික ව්‍යාපාරයේ අදහස් අවශෝෂණය කරගත් සිරිසේන පරමාදර්ශී සිංහල බෞද්ධ ස්ත්‍රිය පිළිබඳ සංකල්පය සමාජගත කිරීමෙහිලා සිංහල නවකථාව මාධ්‍යය කොට ගත්තේය. ඒ අනුව ජයතිස්ස සහ රොස්ලින් ප්‍රමුඛ කොට ගත් ඔහුගේ නවකථා එකී පරමාර්ථ සාධනයෙහිලා නිදසුන් කොට දැක්විය හැකිය. දරුවකුගේ සමාජානුයෝජන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මවකගේ කාර්යභාරය පිළිබඳ සිරිසේනගේ දෘෂ්ටිය මෙකී ජාතිකවාදී අදහස් මත පදනම් වී තිබේ. දරුවකුගේ යහපත් සමාජානුයෝජනයෙහිලා මවකගේ කාර්යභාරය තීරණාත්මක වන බව සිරිසේන ශ්‍රී ලංකා මාතා 1919 කෘතියෙහි ඉදිරිපත් කරන්නේ මෙසේය :

''සත්තටම යහපත් පැවතුම් ඇති මව් කෙනෙක් ළඟම හැදුනොත් ටිකක් හෙඳ කෙනෙක් විය හකියි'' (සිරිසේන 1919 : 102).

තරුණියකගේ ප්‍රේමය (1910) නවකථාවේ පවුලක දරුවන් සම්බන්ධයෙන් මවකගේ කාර්යභාරය මෙසේ අවධාරණය කෙරෙයි :

''ජෝසප් පෙරේරාගේ මැණියෝ සුසානා හාමිනේ ඉතා ගුණවත්, බණ දහම් හා චාරිත්‍ර වාරිත්‍රත් දත් තැනැත්තියකි. ජෝසප් පෙරේරා නොයෙක් වල් මිනිසුන්ගේ ආශ්‍රයට පවා ගිය නමුත් ඔහු ගණන් ගත යුතු සිංහලයකු වූයේත් ස්වකීය මව්ගේ ගුණ යහපත්කම නිසාමයි. මවෙක් යහපත් නම් චාරිත්‍ර වාරිත්‍ර දන්නී නම් ඒ පවුල සම්පූර්ණයෙන්ම අධමභාවයට නොයන්නේමය'' (සිරිසේන 1910 : 98).

මේ අනුව සිරිසේන සහ පෙරේරා යන නිර්මාණකරුවන් දෙදෙනාගේම නිර්මාණවල දරුවන්ගේ සමාජානුයෝජන කාර්යයෙහිලා මවකගේ මැදිහත් වීම පියා ඉක්මවා ගිය තත්වයක අවධාරණය කෙරෙයි. එසේම පොදුවේ සලකා බලන විට එය මවකගේ යුතුකමක් හෝ කාර්යභාරයක් යන්න ඉක්මවා ගිය 'වගකීමක්' බවට අර්ථගන්වා ඇති බව නිරීක්ෂණය කළ හැකිය.

පවුල් ඒකකය ඇසුරෙන් දරුවන් සමාජගත කිරීමේ දී මවකගේ භූමිකාව සම්බන්ධයෙන් තත්කාලීන සිංහල ප්‍රබන්ධ රචකයින්ගේ අවධානය තව දුරටත් යොමු වී තිබේ. 1866 දී කන්නන්ගර දේවගැතිතුමා විසින් රචනා කරන ලද ග්‍රාම ප්‍රවෘත්තියක් නම් ප්‍රබන්ධයෙහි කිතුනු ආගමික ඉගැන්වීම් අනුව දරුවන් සමාජයට සුදුසු ලෙස හැඩගැසීමෙහිලා මව මෙන්ම පියාගේ ද සාමූහික ප්‍රයත්නය අවධාරණය කරයි. නව ප්‍රබන්ධ අනුසාරයෙන් කිතුනු දහමේ සමාජ ව්‍යාප්තිය අරමුණු කොට ගත් ආරම්භක යුගයේ ප්‍රබන්ධවල ස්වරූපය මෙම කෘතියෙන් ප්‍රකාශයට පත් වේ :

''ලමයි නාවා තෙල් අඳුන්ගෑම ගැනත් ඔවුන් පෝෂ්‍ය කෙරීම ගැනත් ඔවුන්ට අකුරු ශාස්ත්‍ර ඉගැන්වීම ගැනත් නොසලකා එක්කෝ එසේ නොකර මව්පියෝ කල්කරන්නහු නම් ඔවුන්ට පාපය බව කියා දුන්නේය'' (කන්නන්ගර 1866 : 34).

අභයගුණවර්ධන නෝමන් ද සිල්වා රචනා කළ මෛත්‍රීපාල (1923) නම් ප්‍රබන්ධය මගින් ද දරුවන්ගේ ප්‍රාථමික සමාජානුයෝජනය මවගේ සහ පියාගේ එනම් දෙමාපියන්ගේ සාමූහික කාර්යයක් වන බව ඉදිරිපත් කරයි ඃ

''ධනපාල බිරිඳ සෝමාවතීට කියන්නේ, දරුවන්ගේ බාල කාලය වනාහි තැනීමට සුදුසු කාලය හෙයින් මව්පියාදීන් විසින් ඉවසීමෙන් හා සිහියෙන් ද යුක්තව හික්මවිය යුතු බවයි'' (අභයගුණවර්ධන 1923 ඃ 39).

ජේම්ස් විජේසිංහගේ ලිලීගේ පොරොන්දුව නම් ප්‍රබන්ධයෙහි ද දරුවන් සමාජගත කිරීමේ දී දෙමාපියන් සතු කාර්යභාරය පිළිබඳ ඉදිරිපත් කරයි. දරුවකුට යහමඟ පෙන්වමින්, ශිල්පායතන වෙත යොමු කර යහපත් සමාජ ප්‍රවේශයක් ලබා දීමේ මාපිය වගකීම බව ගුණතිලකගේ නිර්මාණයෙන් ඉදිරිපත් කෙරෙයි ඃ

''මේ පවුල්වලට මෙසේ අන්තරා කටයුතු සිඬ වෙන්නේ ඔවුනොවුන්ගේ දෙමාපියාදීන්ගේ වරදින්මයි. මෙසේ මම කියන කොට අම්මාටත් තරහා උපදින්ට පුළුවනි. එය කෙසේ වෙතත් කියන්ට තියෙන එක නම් නොකියා බැහැ. දෙමව්පියෝ විසින් දරුවන්ට හොඳින් ශාස්ත්‍රය උගන්වා යහපත් මිත්‍රයන් ආශ්‍රය කෙරෙව්වා නම් කිසි කලෙක මෙබඳු අපරාධ සිඬ නෙවෙයි'' (විජේසිංහ 1919 ඃ 40).

1924 දී ඩී.පී. කුරුකුලසූරිය විසින් රචනා කරන ලද හිල්ඩා නමැති ප්‍රබන්ධයෙහි දරුවන්ගේ ප්‍රාථමික සමාජානුයෝජනය ඉක්මවූ වැඩිහිටි වයස හා සම්බන්ධ දෙමාපිය කාර්යභාරය පිළිබඳ ප්‍රතිනිර්මාණය කර තිබේ. ඒ අනුව 'හොඳ' විවාහ දිවියක් ගත කරනු සඳහා දියණිවරුන් ගොඩනැගීම පවුලක දෙමාපියන්ගේ යුතුකම, කාර්යභාරය වේ ඃ

''එතෙම තමාගේ වැඩිවිය පැමිණි දූවරුන් නිසා කරදරයට නොපැමිණියේය. නමුත් ඔවුන් කෙරෙහි ඉටු කළ යුතු යුතුකම් එකකත් පැහැර නොහැරියේය. මව්පියන් විසින් තමන්ගේ ගැණු දරුවන්ට දිය යුතු උතුම් දායාදය නම් විවාහ ජීවිතය නිසි වූ පරිද්දෙන් ගත කිරීමට ඔවුන් සූදානම් කර තැබීමය'' (කුරුකුලසූරිය 1924 ඃ 27).

විමර්ශනයට ලක් වූ ප්‍රබන්ධ අතර ඇතැම් ප්‍රබන්ධයක දරුවන්ගේ සමාජානුයෝජන කාර්ය සඳහා පවුලක මවක් කිසියම් දුරකට මැදිහත්විය යුතු බව ඉදිරිපත් කෙරෙයි. එහෙත් එය දෙමාපියන් අතර පොදුවේ පැවරී ඇති සහයෝගයෙන් යුතුව ඉටු කළ යුතු යුතුකම් හෝ කාර්යයක් ලෙස විනා මව වෙතම පැවරුණු අත්හළ නොහැකි වූ වගකීමක් ලෙස ප්‍රතිනිර්මාණය නොකරයි. එහෙයින් මෙම නිදසුන් තත්කාලීන සමාජයේ පවුල් සංස්ථාව හා සම්බන්ධ කෘත්‍යාත්මක ක්‍රියාවලිය සම්බන්ධ පොදු, මධ්‍යස්ථ අර්ථකථනයක් ගොඩනගා ගැනීමට ඉවහල් කොට ගත හැකිය. පූර්ව යටත්විජිත සමාජයේ පටන් පවුලක 'මව' යනු දරුවන් සමඟ දීර්ඝ කාලයක් එක්ව කටයුතු කළ පවුලේ සාමාජිකයා බවට පත්ව තිබුණි. විශේෂයෙන්ම කෘෂිකාර්මික සමාජයේ පියාගේ කාර්යභාරය ලෙස සැලකුණු පවුලේ ආර්ථිකය මෙහෙයවන්නාගේ භූමිකාව හේතුවෙන් 'පියා' පවුල සමඟ එක්ව කටයුතු කරන කාලය මවකට සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පවතින බැවිනි. පවුලේ කටයුතු සම්බන්ධයෙන් මවකගේ භූමිකාව සුළු කොට තැකීමක් මෙයින් අදහස් නොවේ. එහෙත් අඩු වැඩි වශයෙන්

දෙමාපියන්ගේ සාමූහික අවධානය දරුවන්ගේ ක්‍රියාකාරකම් හා චරිතය ගොඩනැගීමෙහිලා ඉවහල් වන බව මෙම ප්‍රබන්ධ රචකයෝ ප්‍රතිනිර්මාණය කර දක්වති.

යටත්විජිත සමාජයේ මූලික සමාජ ඒකකය ලෙස ක්‍රියාත්මක වූ පවුල ආශ්‍රිත සමාජානුයෝජන ක්‍රියාවලියෙහි දී මවක සතු වූ කාර්යභාරය විවිධාකාරයෙන් ප්‍රතිනිර්මාණය කිරීමට තත්කාලීන ප්‍රබන්ධකරුවන් උත්සුක වී තිබුණි. ඒ අතර දරුවන් සම්බන්ධ සමාජානුයෝජන කාර්යයෙහි දී එය හුදෙක් මවකගේම වගකීමක් ලෙස සමාජය විසින් පවරනු ලැබූවක් ලෙස නොව, ස්වකීය පවුල් සංස්ථාව සමඟ කෙරෙන අන්‍යොන්‍ය ගනුදෙනුවක විලාසය ගත් ක්‍රියාකාරකමක් ලෙස ද ප්‍රතිනිර්මාණය වී තිබිණ:

''වැඩි පොහොසතකු නොවන පොත් බැඳීම රැකියාව ලෙස කළ ගැමියෙකු වූ දිනෙස් වීරවික්‍රමගේ බිරිඳ වන දෝන කර්ලිනා ඉතා කීකරු යහපත් ස්ත්‍රියකි. වැඩි ඉගෙනීමක් නැති නමුත් ඈ සිහිකල්පනාවෙන් යුක්තව තමාගේ යුතුකම් මනා සේ ඉෂ්ට කළාය. ඇගේ වැදගත් යුතුකම්වලින් එකක් වූයේ ළමයින්ට කෑම ඇදීම සලස්වා දී ඔවුන් නොකඩවා ස්කෝලෙට යැවීමයි. තම යුතුකම් අතපසු නොකර හරියාකාර ඉෂ්ට කිරීම ඇගේ මහත් ආසාව විය'' (වීරසිංහ 1920 : 01).

සමාජානුයෝජනය සම්බන්ධයෙන් පවුලක මවක සතු කාර්යභාරය ඩබ්ලිව්.එම්.සී. මේදිස් විසින් රචිත ලීලාවතී (1914) නමැති ප්‍රබන්ධයෙහි ප්‍රතිනිර්මාණය කෙරෙයි :

''විලීගේ මව් ද තරමක් දුරට සිංහල ඉගෙන සිටි බැවින් සැමදාම සවස් කාලයෙහි ළමයින් ලඟට අඩගසා ඒ ඒ පාඩම් හා ලිවීම් ආදිය ද පරීක්ෂා කර බැලීම පුරුද්දක්ව පැවති බැවින්ද ඔවුන්ගේ ඉගෙනීමට අසහාය හේතුවක් විය'' (මේදිස් 1914 : 4-5).

ද්විතීයික සමාජානුයෝජනය සම්බන්ධයෙන් එනම් විධිමත් අධ්‍යාපනික ආයතන මගින් ලබා දෙන දැනුම හා ආකල්ප වර්ධනය සඳහා අවශ්‍ය පසුබිම් නිර්මාණය සම්බන්ධයෙන් පවුලක මවකගේ උනන්දුව සහ කැපවීම ලීලාවතී නවකතාව ඇසුරෙන් සාකච්ඡා කෙරෙයි.

වර්ෂ 1912 දී සේදිරිස් ගුණවර්ධන රචනා කළප්‍රේමවන්ත විවාහය හෙවත් වික්‍රමරත්න සහ ලිලියන් නමැති නවකතාව, දියණියක් පවුල ඇසුරෙන් ලබන සමාජානුයෝජනය ඇයගේ වගකීම් සහගත අනාගතය ද තීරණය කිරීමෙහිලා බලපාන ආකාරය ප්‍රතිනිර්මාණය කිරීමට ගත් උත්සාහයකි. සමාජානුයෝජනයේ දී දැනුම විෂයයෙහි ලබන ජයග්‍රහණ මෙන්ම තම පරපුර හා සම්බන්ධ අගයන් සහ ආකල්පවලට අනුකූලව අත්පත් කර ගන්නා පරිචය පිළිබඳ මවක් ස්වකීය අවධානය යොමු කළ අයුරු මේ මගින් සනාථ වේ :

''ගෙදර නැවතී සිටගෙන ගොස් ඉගෙනගන්ට පුළුවන් නම් තව ටික කලක් ඉගෙන ගත්තත් වරදක් නැත. මිත්‍රයෙකුගේ ගෙදරක නමුත් ගැනු ළමයෙක් සිටවීම මෙකල අයෝග්‍ය කාරණයකි. ඒ මන්ද යම්කිසි පවුලක ඇති දැඩි වෙන්නා වූ ගැනු දරුවෙක් උනොත් අන්‍ය වූ පිරිමි දරුවන්ට වඩා හොඳ සිහි පරීක්ෂාවෙන් යුක්තවම ඇති දැඩි කළ යුතුමය'' (ගුණවර්ධන 1912 : 10).

විසිවැනි සියවස ආරම්භයේ දී රචිත මෙම කෘතිය, තත්කාලීන ලාංකේය සමාජයෙහි ස්ත්‍රිය පිළිබඳව තහවුරු වී තිබූ අධිපතිවාදී කතිකාව හා සමපාත වූවකි. පිරිමි ළමයාට සාපේක්ෂ වශයෙන් ගැහැනු ළමයා සුරැකිය යුතු බවට පුරුෂ මූලික සමාජයේ ජනප්‍රිය ප්‍රවාදයත්, යටත්විජිත යුගයේ බටහිර සංස්කෘතියත් සමඟ සමාජගත වූ වික්ටෝරියානු සදාචාරය අනුදත් නිකැළැල්, ඒක ස්වාමි වූ කිතුනු පතිනියත් අඩු වැඩි වශයෙන් සමාජානුයෝජනයෙහිලා පවුල තුළ මවකගේ භූමිකාව තීරණය කිරීමෙහිලා බලපාන්නට ඇත.

එම්.සී.එෆ්. පෙරේරාගේ සිරිමැදුර (1908) කෘතියෙහි දක්වෙන පරිදි ජයවීර නොතාරිස් බිරිඳ ස්වකීය දරුවන් සමාජානුයෝජනයෙහිලා කැප වූ අතර පුතුන් දෙදෙනා පාසල්වලට ඇතුළත් කොට අධ්‍යාපනය සඳහා දැඩි සේ උනන්දු කරවීය.

එහෙත් දියණියට ද්විතීයික අධ්‍යාපනය සඳහා අවස්ථාව ලබා නොදෙයි. ඒ වෙනුවට ගෘහමය කටයුතු, මැහුම් ගෙතුම්වලින් යුත් ගැහැනු දරුවකුට උචිත යයි සැලකෙන සාම්ප්‍රදායික අධ්‍යාපනය වෙත යොමු කිරීම මෙහි දී වැදගත් විය. මේ අනුව එකම පවුලක දරුවන්ට ස්ත්‍රී-පුරුෂ බව හේතුවෙන් සමාජානුයෝජන ක්‍රියාවලියෙහි දී දෙයාකාරයක අත්දැකීම්වලට මුහුණදීමට සිදුවෙයි. යටත්විජිත ප්‍රතිපත්තිවලට අනුව කාන්තා අධ්‍යාපනය වර්ධනය කරමින් අභිනව බාලිකා පාසැල් විවෘත වීමත්, සාම්ප්‍රදායික සමාජ අගයන්ට අනුව ස්ත්‍රියක් ඇයට උරුම වූ ගෘහමය ඒකකය වෙත සීමා කර තැබීමත් ප්‍රතිනිර්මිත මෙම ප්‍රබන්ධවලින් සනාථ කෙරෙනුයේ කුමක්ද? සාම්ප්‍රදායික වැඩවසම් ක්‍රමය පූර්ණ වශයෙන් පරාජයට පත් කර අභිනව ධනේශ්වර සමාජයක බිහිවීම සිදු නොවුණු බවයි. එනම් යටත්විජිත යුගයේ මෙරට ධනේශ්වර සමාජ ක්‍රමය පැවති වැඩවසම් ක්‍රමය පෙරළා දමා ඒ මත පූර්ණ ධනේශ්වර පාලන ක්‍රමයක් බිහි නොවූ බවට ඉදිරිපත්ව ඇති මතවාදය (ගුනසිංහ 2011, ජයවර්ධන 2006, බණ්ඩාරගේ 2005) තත්කාලීන ප්‍රබන්ධවල ප්‍රතිනිර්මිත පවුලේ ක්‍රියාකාරිත්වය ඇසුරෙන් සනාථ කෙරෙයි.

සලොමන් දල්පදාදු රචනා කළලිසීගේ වාසනාව (1910) ප්‍රබන්ධයෙහි නිරූපිත රොම්යෙල් මුදලාලි ද ධනේශ්වර සමාජ ක්‍රමය හේතුවෙන් ධනවත් වූ, එහෙත් උගත්කමෙන් තොර පුද්ගලයෙකි. සාම්ප්‍රදායික ජීවනාකල්ප විසින් තත්කාලීන සමාජයේ ප්‍රගතිශීලී එළැඹුම් ස්ත්‍රිය සම්බන්ධයෙන් බලාත්මක නොවූ ආකාරයට මෙම ප්‍රබන්ධය ද නිදසුනකි. තත්කාලීන සමාජ යථාර්ථයෙහි වලංගු බව ප්‍රතිනිර්මාණය කිරීමට ප්‍රබන්ධකරුවන් සමත් වූ බව මෙමගින් සනාථ කෙරේ. නාගරික සමාජයේ බටහිරකරණය වූ පවුල්වල තරුණියන් පියානෝ, රවිකිඤ්ඤා ආදිය වාදනය කරන කල ලිසී කෑම ඉවීම, පොල්ගෑම, බටු මිරිස්, ඉගුරු ආදිය සිටුවීම සිදු කරයි. මේ ඇසුරෙන් සමාජයේ ක්‍රියාත්මක වූ ද්විත්ව සමාජ ක්‍රම එකිනෙකට වෙනස් වූ සමාජ සංස්කෘතික ධාරා දෙකක ශික්ෂණය ලද සමාජ කණ්ඩායම් ද්වයක් නිර්මාණය කිරීමෙහිලා හේතු වූ බව සනාථ කරයි.

## 4. නිගමනය

ප්‍රාථමික සමාජානුයෝජන ඒකකය ලෙස පවුල සතු කාර්යභාරය යටත්විජිත සමාජයේදී ද ක්‍රියාත්මක වූ ආකාරය අදාළ සාහිත්‍යික මූලාශ්‍රය ඇසුරෙන් සනාථ කෙරිණි. පිරිමි දරුවන්ට

සාපේක්ෂ වශයෙන් ගැහැනු දරුවන්ගේ සමාජානුයෝජන කටයුතුවල වගකීම යටත්විජිත යුගයේ ද මව වෙත පැවරුණ වගකීමක් විය. නව ධනේශ්වර පවුලෙහි කුල වටිනාකම් සහ ඇගයීම් පද්ධතීන්ගේ ආරක්ෂකයින් ලෙස ස්වකීය දියණිවරුන් හැඩගැස්වීමෙහිලා අවශ්‍ය අනුයෝජන කාර්යභාරය අභිනව පවුලක මව වෙතත පැවරුණි. එමෙන්ම නව ආර්ථික හා දේශපාලන තලයේ ක්‍රියාකාරීන් ලෙස පුරුෂයන්ට කටයුතු කිරීමට අවකාශ සලසා දෙමින් පවුලක සමාජ සංස්කෘතික භූමිකාව භාර ගැනීමට උචිත / සුදුසු කුල කාන්තාවන්, සිංහල බෞද්ධ මහිලාවන් බිහි කිරීමේ මෙන්ම හැඩගැස්වීමෙහි නැතහොත් විශිෂ්ට දියණිවරුන් සමාජානුයෝජනය කිරීමෙහි 'නව පවුලේ' මවක සතු වගකීමක් වූ බව ප්‍රබන්ධගත නිදසුන් මගින් සනාථ විය. සාම්ප්‍රදායික පවුලෙහි දැනුම හා ආකල්ප ගොඩනැගීම ශිල්ප ශ්‍රේණි ඇතුලත පවුල් සංස්ථාව මගින්ම සිදු වූවකි. එහෙයින් දරුවෝ සාමාන්‍ය වශයෙන් අභ්‍යන්තර පවුල් ක්‍රියාකාරකම් ඇසුරෙහි දීම එකී අනුයෝජන ක්‍රියාවලියෙහි නිරත වෙති. නව සමාජය තුළ වෘත්තීය හෝ ආර්ථික ක්‍රියාවලිය පවුලෙන් පරිබාහිරව ක්‍රියාත්මක වීම හේතුවෙන් මවක සතු වූ දරුවන්ගේ සමාජානුයෝජන වපසරිය සාපේක්ෂ වශයෙන් වඩා පුළුල් තලයක ක්‍රියාත්මක විය. එහි දී දියණියන් සම්බන්ධයෙන් මවකට මුහුණදීමට සිදුවන සමාජානුයෝජන අභියෝග වඩා බරපතල වෙයි. මාර්ටින් වික්‍රමසිංහගේ 'මිරිඟුව' (1925) නවකතාවෙහි මොලී දනසූරිය නමැති දියණියට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදෙනුවස් නිවසට කැඳවූ බ්‍රිතාන්‍ය ජාතික ගුරුවරයාගෙන් මොලීට දරුවෙකු පිළිසිඳ ගැනීමේ අවස්ථාවේ දී ඇයගේ මව මුහුණදුන් අභියෝගාත්මක අර්බුදය මගින් මෙම තත්වය පැහැදිලි කොට ගත හැකිය. මේ අනුව මූලික වශයෙන් දරුවන්ගේ සමාජානුයෝජනය මවක සතු වූ වගකීමක් ලෙස තවදුරටත් වලංගුව පැවති බව ප්‍රබන්ධ විමර්ශනයෙන් නිගමනය කළ හැකිය.

## 5. පරිශීලිත ග්‍රන්ථ

**ප්‍රාථමික මූලාශ්‍රය**

අභයගුණවර්ධන, නෝමන් ද සිල්වා 1923. මෛත්‍රීපාල, ප්‍රකාශනය සඳහන් නොවේ.

කන්නන්ගර දේවගැතිතුමා, එච්.1876. ග්‍රාම ප්‍රවෘත්තියක්. කොළඹ, ලංකා ආගමික ප්‍රචාරක සමිතිය.

කුරුකුලසූරිය, ඩී.පී. 1924. හිල්ඩා. ප්‍රකාශනය සඳහන් නොවේ.

ගුණවර්ධන, සේදිරිස් 1912. ප්‍රේමවන්ත විවාහය හෙවත් වික්‍රමරත්න සහ ලිලියන්.ප්‍රකාශනය සඳහන් නොවේ.

දල්පදාදු, සලමොන්. 1910. ලිසීගේ වාසනාව. ප්‍රකාශනය සඳහන් නොවේ.

පෙරේරා, එම්. සී. එෆ්.1908. මගේ පෙම්බරී. කොළඹ : සිංහල සමය මුද්‍රණාලය.

1908. සිරි මැදුර. කොළඹ : සිංහල සමය මුද්‍රණාලය.

1911. විනාශ වූ නෞකාව. කොළඹ : සිංහල සමය මුද්‍රණාලය

වික්‍රමසිංහ, මාර්ටින් 1925. මිරිඟුව, ප්‍රකාශනය සඳහන් නොවේ

වීරසිංහ, එස්.එස්. 1920. එමලියානා, ප්‍රකාශනය සඳහන් නොවේ.

විජේසිංහ, ජේ. 1919. ලිලීගේ පොරොන්දුව. කොළඹ : ඩබ්ලිව්. ඊ. බැස්ටියන් සහ සමාගම.

සිරිසේන, පියදාස. (1906) 1966. ජයතිස්ස සහ රොසලින් හෙවත් වාසනාවන්ත

විවාහය. ප්‍රකාශනය සඳහන් නොවේ.

1910. තරුණියකගේ ප්‍රේමය. කොළඹ, සද්ධර්ම ප්‍රකාශන මුද්‍රණාලය.

1910. තරුණියකගේ ප්‍රේමය. කොළඹ, සද්ධර්ම ප්‍රකාශන මුද්‍රණාලය.

මේදිස්, ඩබ්ලිව්.එම්.සී. 1914. ලීලාවතී, ප්‍රකාශනය සඳහන් නොවේ.

1919. ශ්‍රී ලංකා මාතා කොළඹ : ස්වාධීන මුද්‍රණාලය

**ද්විතීයික මූලාශ්‍රය**

එංගල්ස්, ෆ්‍රෙඩ්රික් (අනු. රොඩ්රිගු ඩී.වී.) 1979. පවුල, පෞද්ගලික දේපල හා රජය ඇති වූ හැටි, මොස්කව් ප්‍රගති ප්‍රකාශන.

ආරියපාල, ඇම්.බී. 1996. මධ්‍යකාලීන ලංකා සමාජය. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගයිගර්, විල්හෙල්ම් (පරි)ඇම්. බී. ආරියපාල 1969. මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම.

ජයවර්ධන, කුමාරි 2006. සොක්කන් ලොක්කන් වූ වගයි. ශ්‍රී ලංකාවේ යටත්විජිත ධනේශ්වරයේ නැගීම. කොළඹ : සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.

තිරුචන්ද්‍රන්, සිල්වි 1995. ස්ත්‍රීවාදී දර්ශන කෝණයෙන් සමාජ න්‍යායයන් විග්‍රහ කිරීමක්. කාන්තා අධ්‍යාපන සහ පර්යේෂණ කේන්ද්‍රය.

පෙරේරා, රංජිත් (සංස්)2011. නිව්ටන් ගුණසිංහ - තෝරාගත් ලිපි : 1. කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

බණ්ඩාරගේ. අසෝකා 2005. ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය. පන්නිපිටිය: සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් පෞද්ගලික සමාගම.

රාජකරුණා, ආරිය1970 (2012). සාහිත්‍ය රුචිය හා නවකතා විචාරය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, මාර්ටින්1961. උපන්දා සිට. දෙහිවල: තිසර ප්‍රකාශකයෝ.

**English**

Coomaraswami, A 1908. The Village Community and Modern Prograss. Colombo Apothecaries.

Murdock, George Peter 1949. Social Structure. New York : Macmillan Company

Rao, C.N. Shanker 1999. Sociology. New Delhi: S. Chand Company.

Robertson, Ian 1980. Sociology. New York: Worth Publishing Inc.